ACCELERATING INDUSTRIES' CLIMATE RESPONSE
SRI LANKA

FACTSHEET

හරිතාගාර වායු විමෝචනය විනිවිදභාවයකින් යුතුව වාර්තාකිරීම: ශ්‍රී ලංකාවේ කර්මාන්ත සඳහා හරිතාගාර වායු විමෝචනය මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රමවේදයක් සකසාගැනීම

හැඳින්වීම

පැරිස් ගිවිසුම යටතේ, එකඟ වී ඇති ජාතික මෙහෙවරවල් ඉටුකිරීමට රටවල් බැඳී සිටී. හරිතාගාර වායු විමෝචනය විනිවිදභාවයකින් යුතුව වාර්තාකිරීම: ශ්‍රී ලංකාවේ කර්මාන්ත සඳහා හරිතාගාර වායු විමෝචනය මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රමවේදයක් සකසාගැනීම.

මෙයින් ප්‍රකාශවන්නේ පාර්ශව රාජ්‍ය ජාතික හරිතාගාර වායු විමෝචනය අවමකරන ආකාරයයි. එකඟවී ඇති ජාතික මෙහෙවර ඉටුකිරීමේ ඉලක්ක සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වාර්තාකිරීමට හැකියාව ලැබෙන ආකාරයෙන් පාර්ශව රාජ්‍යයන් හරිතාගාර වායු විමෝචන ප්‍රමාණය සහ විමෝචන අවම කරනලද ප්‍රමාණය දැනගැනීම සඳහා මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය ක්‍රමය යොදාගනු ලැබේ. හරිතාගාර වායුවිමෝචන ඉන්වෙන්ටරිය ලෙස හඳුන්වන මෙම ක්‍රමය මගින් ඉතා විනිවිදභාවයෙන් යුතුව හරිතාගාර වායු විමෝචනය සහ අවමකිරීමේ ප්‍රමාණය වාර්තාකරනු ලැබේ.

දේශගුණ විපර්යාස පිළිබඳ 26 වන පාර්ශවකරුවන්ගේ සමුළුවේදී සෑම වසර දෙකකට වරක් හරිතාගාර වායු විමෝචනය අවමකිරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය ගැන වාර්තාකිරීමට (BTRs) පාර්ශව රාජ්‍යයන් එකඟවිය. ඉහළ ආදායම් ලබන රටවල් ද දේශගුණ විපර්යාස සම්බන්ධ කටයුතුවලට මුදල් යෙදවීම ගැන වාර්තා කළ යුතුය (අඩු සහ මැදි ආදායම් ලබන රටවල් එසේ ක්‍රියාකිරීමට දිරිගන්වනු ලැබේ)*. හැකියාව ඇත්නම් මේ වැඩපිළිවෙලට අනුගතවීම පිණිස ගන්නා ක්‍රියාමාර්ග ගැන වාර්තා කරන ලෙස සියලුම රටවලින් ඉල්ලා සිටිනු ලැබේ.

සම්බන්ධතා සඳහා


නිකලස් ඩෙහොඩ්
UNIDO ව්‍යාපෘති කළමනාකරු
N.DEHOD@unido.org

ජගත්දේව විදානගම
ප්‍රධාන තාක්ෂණ විශේෂඥ
UNIDO
J.VIDANAGAMA@unido.org

මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපන සඳහා ක්‍රමවේදයක් සකසාගන්නේ කෙසේද?

මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය සඳහා වන ක්‍රමවේදය කුලුනු තුනක් මත ක්‍රියාත්මක වෙයි:

1. ආයතනික විධිවිධාන: කාර්යභාරය සහ වගකීම් සහ නෛතික රාමු තීරණය කරන ආයතනික සැලැස්ම.
2. තොරතුරු හුවමාරුව: දත්ත රැස්කරන සහ හුවමාරුකරගන්නා ආකාරය තීරණය කරන මාර්ගෝපදේශ සහ ආකෘති.
3. පරිගණක දත්ත පද්ධතිය: යෙදවුම් රැස්කිරීම සහ බෙදාගැනීම පිණිස තොරතුරු තාක්ෂණ පද්ධතියක්.



Visual from GAUSS (adapted)

*ලෝක බැංකුව පහළ මැදි ආදායම් රටක් ලෙස වර්ගීකරණය කර ඇත

මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය සඳහා වන ක්‍රමවේදයක් පිහිටුවීමේ ප්‍රථම පියවර වන්නේ ආයතනික විධිවිධාන මෙන්ම කර්තව්‍යයන්, කාර්යභාරය සහ ධාරිතාවන් පැහැදිලි කිරීමයි.

1 සම්බන්ධීකරණය, වාර්තාකරණය සහ අධිලේඛනකරණය

කාර්යභාරය - සම්බන්ධීකරණය, සැලසුම්කරණය, අධීක්ෂණය, වැඩිදියුණුකිරීම, කාර්යක්‍රම සැලසුම්කිරීම, වාර්තාකරණය සහ අධිලේඛනකරණය.

අපේක්ෂිත අවශ්‍යතාවයන් - දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් ක්‍රියාකරන පිළිගත් ජාතික ආයතනය.

2 අංශ ප්‍රධානීන්

කාර්යභාරය - හරිතාගාර වායු ඉන්වෙන්ටරිය සම්පාදනය කිරීමට දත්ත රැස්කිරීම සහ සැපයීම. විශ්ලේෂණය, සංරක්ෂණය, ප්‍රතිඵලවල තත්වය සහතිකකිරීම, තාක්ෂණ තලයේදී ආංශික සංවර්ධනය උදෙසා සැලසුම් ඉදිරිපත් කිරීම.

අපේක්ෂිත අවශ්‍යතාවයන් - හරිතාගාර වායු ඉන්වෙන්ටරි සම්බන්ධයෙන් ගැඹුරු දැනුමක් දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (IPCC) විසින් අර්ථනිරූපනය කර ඇති විමෝචන අංශ ඇතුළත මනා සහයෝගිතා සහ නිරීක්ෂණ කාර්ය භාරය.

3 දත්ත සැපයුම්කරුවන්

දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩල සියලු අංශවල (පරිභෝජනය, නිෂ්පාදනය, උත්පාදනය හෝ පරිහරණය) විමෝචන කාරක පිළිබඳව අදාළ දත්ත දරන්නන්.

Visuals from Gauss Intl. Consulting (adopted)

4 ඇස්තමේන්තුකිරීම සහ සම්පාදනය

කාර්යභාරය - දත්ත විශ්ලේෂණය, තත්ව පාලනය, තාක්ෂණ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම, ජාතික ඉන්වෙන්ටරි ප්‍රලේඛන අංශය සමග අධිලේඛනකරණය සහ විස්තර විභාග දැක්වීම.

අපේක්ෂිත අවශ්‍යතාවයන් - සියලු දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (IPCC) අංශවල හරිතාගාර වායු විමෝචන තක්සේරුකිරීමේ සහ ප්‍රමාණකරණය ගැන තාක්ෂණික දැනුම (සංඛ්‍යාලේඛන දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය මාර්ගෝපදේශ හරිතාගාර වායු ඉන්වෙන්ටරිය වාර්කිරීමේ අවශතා).

5 අන්තර්ආංශීය තාක්ෂණ කමිටු

කාර්යභාරය හා අපේක්ෂිත අවශ්‍යතාවයන් - හරිතාගාර වායු ඉන්වෙන්ටරිය පිළිබඳ ද්විවාර්ෂික වාර්තා අංශයේ තත්ත්ව සහතිකය සංරක්ෂණ සහ සංවර්ධන සැලසුම්, හරිතාගාර වායු ඉන්වෙන්ටරිය සහ විධික්‍රම, පටිපාටිය සහ මාර්ගෝපදේශ (MPGs) මගින් දක්වා ඇති පරිදි වාර්තාකරණ මාර්ගෝපදේශ ගැන මනා තාක්ෂණ දැනුමක් ලබාතිබීම.

6 ඉහළ තලයේ ආයතනික ව්‍යුහය

කාර්යභාරය හා අපේක්ෂිත අවශ්‍යතාවයන් - අධීක්ෂණය (දේශපාලනික අයත්බව සහ තීරණ ගැනීම) සහ හරිතාගාර වායු ඉන්වෙන්ටරිය පිළිබඳ වාර්තාකිරීමේ අවසන් අනුමැතිය ආංශීය ප්‍රතිපත්ති සම්පාදනයේ ඉහළ තලයේ ආයතන.

මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මකවන්නේ කෙසේද?

සැලසුම්කිරීමෙන් සහ සම්බන්ධීකරණයෙන් පසුව, සංඛ්‍යාලේඛන කාර්යභාංශය සහ උපයෝගිතා සේවා සමාගම් වැනි දත්ත සැපයුම්කරුවන් ලෙස තෝරා ගනු ලැබූ ආයතන හෝ සමාගම් දත්ත රැස්කරයි. පෙරමුණගන්නා අංශය ඊළඟට මෙම දත්ත රැස්කර සම්පාදකවරයාට යොමු කරන අතර එමගින් දත්ත විශ්ලේෂණය කර සම්පාදනය කරයි. අනතුරුව තාක්ෂණ විශේෂඥයන්ගේ කමිටුව එම දත්තවල ගුණාත්මක බව සත්‍යාපනය කරයි. ඉන්පසු එම දත්ත රජයේ විශේෂඥයන්ට වාර්තාකරණ අතර ඔවුන් එය අනුමත කිරීමෙන් පසුව දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) වෙත වාර්තා කරයි.

දෙවසරක චක්‍රයක් තුළ සංනිවේදන ප්‍රවාහය

1 **සම්බන්ධීකාරක**
සැලසුම්කරණය සහ විශ්ලේෂණය සම්බන්ධීකරණය

2 **අංශ ප්‍රධානීන්**
දත්ත සැපයීම සහ දත්ත රැස්කිරීම

3 **සම්පාදනය**
වාර්තා නිමායනය, විශ්ලේෂණය සහ විස්තර විභාගදැක්වීම

4 **තාක්ෂණික සත්‍යාපනය**
වාර්තා සත්‍යාපනය කිරීම

5 **දේශපාලන වලංගුකිරීම**
වාර්තා අනුමතකිරීම සහ තීරණගැනීම

6 **සම්බන්ධීකාරක**
දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) වෙත වාර්තාකිරීම

Visuals from Gauss Intl. Consulting (adopted)

කර්මාන්ත ක්ෂේත්‍රයේ හරිතාගාර වායු විමෝචනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රමවේදයක් අවශ්‍ය ඇයි?

2019 දී, ශ්‍රී ලංකාවේ බලශක්ති ඉල්ලුමෙන් අඩකට වැඩි ප්‍රමාණයක් සපයන ලද්දේ ආනයනික පොසිල ඉන්ධනවලිනි. ශ්‍රී ලංකාවේ කර්මාන්ත බහුල ලෙස පොසිල ඉන්ධන පාදක බලශක්ති පාරිභෝගියන්ගෙන් එක් අංශයකි; එම අංශය රටෙහි තෙල් නිෂ්පාදනවලින් සියයට 15 ක් පමණ සහ එහි විදුලි බලයෙන් සියයට 33 ක් යොදා ගනී. 2030 වන විට, කර්මාන්ත අංශයෙන් සිදුවන වායු විමෝචනයන් සියයට 7 කින් අඩුකිරීමට ශ්‍රී ලංකා රජය බැඳී සිටී. විවිධ මාර්ගවලින් රටේ මෙම ඉලක්කය සාක්ෂාත්කරගැනීමට විනිවිදභාවයෙන් යුතුව මැනීමේ, වාර්තාකරණ සහ සත්‍යාපන ක්‍රමවේදයක් පවත්වාගෙන යාම උපකාරවෙයි.

වගවීම සහ විශ්වසනීයත්වය: කර්මාන්ත ක්ෂේත්‍රයේ හරිතාගාර වායු විමෝචනය සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විනිවිදභාවයෙන් යුත් ක්‍රමවේදයක් සහ එය අවමකිරීමේ ක්‍රියාවලියක් යොදා ගැනීම මගින් ශ්‍රී ලංකාවට එකඟවී ඇති ජාතික මෙහෙවරවල් වැනි ඉලක්කවල කොටසක් ලෙස, එය බැඳී සිටින දේශීය සහ අන්තර්ජාතික වාර්තාකරණ අවශ්‍යතා මනා ලෙස සපුරාලීමට හැකිවනු ඇත. කලක් ගතවනවිට ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචන දත්ත ලබාගැනීමේ හැකියාව සහ ඒවායේ ගුණාත්මක තත්වයද වර්ධනය වෙයි.

ක්‍රියාකිරීම පිණිස උපායමාර්ගික ක්ෂේත්‍ර හඳුනාගැනීම: මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපන ක්‍රමවේදයකින් ශ්‍රී ලංකාවට එහි කර්මාන්ත ක්ෂේත්‍රය තුළ හරිතාගාර වායු විමෝචන මූලාශ්‍ර හා ප්‍රවණතා හඳුනාගැනීමට සහ ඒවා අවම කිරීමේ ප්‍රතිපත්ති ගැන අවබෝධයක් ඇතිකර ගැනීමට හැකිවන නමුත් එයම ඒවා විධිමත් කිරීමට, වඩාත් වැදගත් ඒවා හඳුනාගැනීමට, සහ තිරසර ආකාරයකින් ඒවා සම්බන්ධයෙන් දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට වාර්තා කිරීමට උපකාරයක් වෙයි.

විස්තරකිරීම:

හරිතාගාර වායු විමෝචන ය සිදුවන ප්‍රධාන මූලාශ්‍ර හතර

දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටුව හරිතාගාර වායු විමෝචනය සිදුවන මූලාශ්‍ර අංශ හතරකට කාණ්ඩකරයි:

(1) බලශක්ති
(2) නිෂ්පාදන ක්‍රියාවලි සහ භාණ්ඩ පරිහරණය
(3) කෘෂිකර්මය, වනාන්තර සහ වෙනත් ඉඩම් පරිහරණයන්
(4) කසළ

ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ මැනීම වාර්තාකරණය සහ සත්‍යාපන ක්‍රමවේදය මගින් බලශක්ති සහ නිෂ්පාදන ක්‍රියාවලි සහ භාණ්ඩ පරිහරණ අංශ ආවරණය වන අතර එයට හේතුව කර්මාන්තවලින් නිපදවන හරිතාගාර වායු විමෝචන මෙම කාණ්ඩ දෙකටම සම්බන්ධව තිබීමයි.

දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට (UNFCCC) ශ්‍රී ලංකාව එහි සංශෝධිත එකඟවූ ජාතික මෙහෙවරවල පසුගිය වාර්තාව ඉදිරිපත් කළේ 2021 දීය. ඔබට **මෙහිදී** එම වාර්තාව කියවිය හැකිය.

ශ්‍රී ලංකාවේ සිදුවෙමින් පවතින්නේ කුමක්ද?

කර්මාන්ත ක්ෂේත්‍රයේ හරිතාගාර වායු විමෝචන සහ අවමකිරීමේ ක්‍රියාමාර්ග උදෙසා මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම පිණිස යුරෝපීය සංගමයේ අරමුදල් සැපයීමක් මාර්ගයෙන්, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය ශ්‍රී ලංකා රජය, ප්‍රධාන කර්මාන්තකරුවන් සහ බලශක්ති විශේෂඥයන් සමඟ එක්මන් දත්ත රැස්කිරීම සහ වාර්තාකරණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීමට ක්‍රියාකරමින් සිටී. පහත දැක්වෙන දේවල්වලින් මෙය මැනීම සහ වාර්තාකිරීම සිදුවෙයි.

1. විමෝචන: කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා හරිතාගාර වායු ඉන්වෙන්ටරිය විමෝචන උපදවන මාර්ග:
(1) බලශක්ති කර්මාන්ත
(2) නිෂ්පාදන ක්‍රියාවලි සඳහා යොදා ගන්නා ඉන්ධන
(3) නිෂ්පාදන ක්‍රියාවලි සහ භාණ්ඩ පරිහරණය (උදාහරණ වශයෙන් ඛනිජ ,රසායනික, ලෝහ, ඉලෙක්ට්‍රොනික් හා කඩදාසි සහ ආහාර නිෂ්පාදනය වැනි සෙසු අංශ)

2. අවමකිරීම: හරිතාගාර වායු විමෝචන අවමකිරීමට ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ක්‍රියාමාර්ග මෙය සමන්විතවන්නේ:
(1) විමෝචනය අඩුකිරීම්
(2) ලබන ප්‍රගතිය මැනීම

ශ්‍රී ලංකාව එහි කර්මාන්ත ක්ෂේත්‍රයේ මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රමවේදය සකස්කර ගන්නේ කෙසේද?

පියවර 1 තොරතුරු ලබාගැනීමේ ක්‍රියාවලිය (දේශගුණ විපර්යාස සිදුවීමට අදාළවන ක්‍රියාකාරකම්, දත්ත මූලාශ්‍ර හා දත්ත සැපයුම්කරුවන්, පරිගණක දත්ත පද්ධති හා වේදිකා සම්බන්ධයෙන් වත්මන් ආයතනික කාර්යභාරය සහ වගකීම් තක්සේරුකිරීම)

පියවර 2 පාර්ශවකරුවන්ගේ උපදෙස් ලබාගැනීම හා ධාරිතා ගොඩනැංවීම

පියවර 3 සකස්කරන ලද මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය රාමුව

පියවර 4 නියමු මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රමවේදය

පියවර 5 මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය ආකෘතියට සිදු කළ වෙනස්කිරීම්

පියවර 6 ධාරිතාව ශක්තිමත්කිරීම

පියවර 7 ක්‍රියාත්මක කිරීමේ පෙරදැක්ම නිර්මාණය කිරීම

පියවර 8 ක්‍රියාත්මකකිරීම

Visuals from Gauss Intl. Consulting (adopted)

සම්බන්ධ පාර්ශව කවරේද?

ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය පහළ කාබන් ප්‍රමාණයක් නිකුත් කරන අනාගතයක් කරා පරිවර්තනය කිරීම පිණිස ආධාර කිරීමට සැලසුම් කළ පස්අවුරුදු මූලාරම්භ වැඩසටහනක් වන **ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ කඩිනම් දේශගුණ ප්‍රතිචාරය වැඩසටහන** යටතේ කර්මාන්ත ක්ෂේත්‍රයේ මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රමවේදය සම්පාදනය කරගෙන යනු ලැබේ. කර්මාන්ත අමාත්‍යාංශයේ සහ විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ සහයෝගිත්වයෙන් පරිසර අමාත්‍යාංශයේ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය මෙම වැඩසටහන මෙහෙයවයි. එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය විසින් ක්‍රියාත්මක කරණු ලබන මෙම වැඩසටහනට යුරෝපීය සංගමය ගෝලීය කාලගුණ විපර්යාස පිළිබඳ සංධානය යටතේ අරමුදල් සපයයි.

ශ්‍රී ලංකාවේ මැනීමේ, වාර්තාකරණයේ සහ සත්‍යාපන ක්‍රමවේදය අධීක්ෂණය කිරීමට, සැලසුමට මගපෙන්වීමට, සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරී කණ්ඩායමකට දේශගුණ විපර්යාස ලේකම්කාර්යාලය නායකත්වය දෙයි. එම මැනීමේ, වාර්තාකිරීමේ සහ සත්‍යාපන ක්‍රමවේදය පිලිබඳ ක්‍රියාකාරී කණ්ඩායම රාජ්‍ය ආයතන සහ දෙපාර්තමේන්තු සහ කර්මාන්තකරුවන්ගෙන් සමන්විතය.

වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය ද?

මැනීමේ, වාර්තාකරණයේ සහ සත්‍යාපනය පිළිබඳ ක්‍රමවේදය / විනිවිදභාවයෙන් යුත් පද්ධති පිලිබඳ ප්‍රයෝජනවත් සම්පත් කිහිපයක් පහත දැක්වෙයි.

- මැනීමේ, වාර්තාකරණයේ සහ සත්‍යාපනය පිළිබඳ ක්‍රමවේද පිළිබඳ **එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස අරමුදලේ සම්පත්**
- දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියෙහි වැඩිකළ විනිවිදභාවයෙන් යුත් රාමුවෙහි **පොදු දළ විශ්ලේෂණය** (General overview of the UNFCCC Enhanced Transparency Framework)
- දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ වැඩිකළ විනිවිදභාවයෙන් යුතු රාමුව සඳහා **විධික්‍රම, පටිපාටි සහ මාර්ගෝපදේශ** (Modalities, procedures, and guidelines for the UNFCCC Enhanced Transparency Framework)
- ජාතික මැනීමේ, වාර්තාකරණයේ සහ සත්‍යාපනය පිළිබඳ ක්‍රමවේද සකස්කිරීම පිණිස **පොදු මාර්ගෝපදේශ** (General guidelines for developing national MRV systems)
- ලෝක බැංකු සම්පත් ආයතනයේ **මැනීමේ, වාර්තාකරණයේ සහ සත්‍යාපනය පිළිබඳ ක්‍රමවේද දළ විශ්ලේෂණය** (The World Resources Institute's MRV overview)
- **කෙන්යාවේ** සහ **වනවාටු** හි මැනීමේ, වාර්තාකරණයේ සහ සත්‍යාපනය පිළිබඳ ක්‍රමවේද උදාහරණ (Examples of MRV systems in Kenya and Vanuatu)

ශ්‍රීලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ දේශගුණ ප්‍රතිචාරය කඩිනම් කිරීම ව්‍යාපෘතිය, යුරෝපීය සංගමය අරමුදල් සපයන සහ එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය, පරිසර අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය, සහ විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය සමඟ ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියකි.

European Union

Ground Floor, New CSL Building | No. 133, Kinsey Road, Colombo 08, Sri Lanka.
Tel/Fax: +94 112689155, E-mail: aicr-srilanka@unido.org